| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date | 2026.07.20 |
|---|---|---|---|

පැමිණිලි පාර්ශවය : චතුර රංගන ද සිල්වා මයා,
කනත්තවත්ත,
අමුගොඩ.

වගඋත්තර පාර්ශවය : (01) පො.ප. ජී.ඒ.ඒ. පුෂ්පකුමාර මයා,
හිටපු ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
පිටිගල.
(වර්තමාන සේවා ස්ථානය - විශේෂ අපරාධ විමර්ශන අංශය, පොලිස් අධිකාරී කාර්යාලය, කාලිදාස පාර, මාතර)

(02) කා.පො.කො. 8206 මහේෂිකා මිය,
පොලිස් ස්ථානය,
පිටිගල.

(03) උ.පො.ප. වික්‍රමසිංහ මයා,
පොලිස් ස්ථානය,
පිටිගල.
(වර්තමාන සේවා ස්ථානය - පොලිස් ස්ථානය, මීටියාගොඩ)

**<u>පැමිණිලි අංකය: HRC/4306/23</u>**

**පැමිණිලි පාර්ශවයේ පැමිණිල්ල**

පැමිණිලිකරු විසින් 2023.10.27 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කර ඇති අතර, එකී පැමිණිල්ල සම්බන්ධයෙන් පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පැවති පරීක්ෂණයේදී ලබා දී ඇති ප්‍රකාශය පහත පරිදි වේ.

**පැමිණිල්ල සම්බන්ධයෙන් පැමිණිලිකරුගේ ප්‍රකාශය:**

2023.10.25 වන දින තමා රැකියා ස්ථානයට ගොස් සිටියදී ප.ව.12ත් 12.30ත් අතර ඉන්දික යන අය පැමිණ තමාගේ පුංචි අම්මලා නිවසට ඇතුළු වීමට උත්සාහ දරන බවට තමාට දැනුම්දුන් බවත්, තමාගේ නිවස පයින් ඇවිද යා හැකි දුරක පිහිටා ඇති බැවින් එම අවස්ථාවේදී තමා රැකියා ස්ථානයෙන් පිටව නිවස බලා ගිය බවත්, එම අවස්ථාවේදී පොලිස් නිලධාරීන් දෙදෙනෙක් පාරේ සිටින බවට තමා දුටු බවත්, තමා නිවස අසලට යන විට තමාගේ පුංචි අම්මලා තිදෙනා සමඟ තවත් කාන්තාවක් (මෙම කාන්තාව නීතිඥවරියක් බවට පසුව හඳුනාගෙන ඇත) නිවසේ දොර විවෘත කිරීමට උත්සාහ කරමින් සිටින බවට දුටු බවත්, එම අවස්ථාවේදී නිවස තුළ කවරෙකු හෝ නොසිටි බවත්, තමාගේ බිරිඳ රැකියා ස්ථානය වෙතද, දරුවන් පාසල වෙතද ගොස් සිටි බවත්, දොර විවෘත කිරීමට උත්සාහ කරන හේතුව විමසීමේදී ඔවුන්ට නිවස පිළිබඳව අයිතියක් තිබෙන බැවින් නිවසේ දොර විවෘත කරන බවට පවසා සිටි බවත්, එම අවස්ථාවේදී තමා සහ පුංචිඅම්මලා අතර බහින්බස්වීමක් සිදුවූ බවත්, එම ස්ථානයට පැමිණ සිටි පොලිස් නිලධාරීන් විසින් මෙම ගැටළුව මේ ආකාරයට විසඳා ගැනීමට නොහැකි බවට පවසමින් පොලිස් ස්ථානයට ගොස් විසඳා ගන්නා ලෙසට ප්‍රකාශ කළ බවත්, පුංචි අම්මලා තිදෙනා සහ ඔවුන් සමඟ පැමිණි නීතිඥ මහත්මිය පිටව ගිය පසුව මෙම සිදුවීම සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට දවල් 12.30ත් 1.30ත් අතර පිටිගල පොලිස් ස්ථානය වෙත ගිය බවත්, තමාට පැමිණිල්ලක් ගොනු කිරීමට අවශ්‍ය බවට සෙනෙවිරත්න යන නිලධාරියාට ප්‍රකාශ කළ අවස්ථාවේදී ස්ථානාධිපතිවරයා හමුවෙන ලෙස දැන්වූ බවත්, තමා ස්ථානාධිපතිවරයා හමුවීමට ගිය අවස්ථාවේදී තමාගේ පුංචිඅම්මලා සමඟ නිවසට පැමිණි නීතිඥ මහත්මිය ස්ථානාධිපති සමඟ කතා කරමින් සිටින බව දුටු බවත්, ඔවුන් විනාඩි 20ක් පමණ ස්ථානාධිපතිවරයා සමඟ කතා කිරීමෙන් අනතුරුව පිටතට පැමිණි බවත්, එවිට තමා ස්ථානාධිපතිවරයාගේ කාමරය තුළට යාමට කටයුතු කිරීමේදී පිටතට යන ලෙස දැන්වූ බවත්, තමා නැවත උපසේවය වෙත ගිය බවත්, සුළු වෙලාවකින් ස්ථානාධිපතිතුමා පැමිණ තමා අත්අඩංගුවට ගන්නා ලෙස පැවසූ බවත්, එම අවස්ථාවේදී තමාගේ මස්සිනාට දුරකථන ඇමතුමක් ලබාදී මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් සිදුකළ බවත්, තමා සිදුකළ වරද විමසීමේදී බීමතින් අශෝභන ලෙස හැසිරුණ බවට ප්‍රකාශ කළ බවත්, පැය දෙකක් පමණ ගතවන තෙක් සෙනෙවිරත්න නිලධාරියා තමාට එරෙහිව පැමිණිල්ලක් සටහන් නොකළ බවත්, තමාට එරෙහිව චෝදනාව සටහන් කරන්නේ කවර කරුණක් සම්බන්ධයෙන්ද යන්න ගැටලුවක් වූ බවත්, පසුව තමා සිර මැදිරිය තුළට දමා විනාඩි 10-15කට පමණ පසුව පිටතට ගෙන

පුටුවක වාඩි වන ලෙස පැවසූ බවත්, තමාගේ මතකය පරිදි සවස 4ට පමණ මහේෂිකා නිලධාරිනිය පැමිණ තමාට විරුද්ධව තිබෙන චෝදනාව සම්බන්ධයෙන් සටහන් තබා සවස 5.30ට පමණ ඇල්පිටිය රෝහලට ගෙන යාමට කටයුතු කළ බවත්, එහිදී තමා බීමතින් නොමැති බවට වෛද්‍යවරයා තහවුරු කළ බවත්, හවස 6.30ත් 7.00ත් අතර නැවත පොලිස් ස්ථානය වෙත රැගෙනවිත් පොලිස් ඇප ලබා දී තමා පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කිරීමට පැමිණි පැමිණිල්ල ඉදිරිපත් කර පිටව යන ලෙස ස්ථානාධිපතිවරයා විසින් දැනුම්දුන් බවත්, තමාගේ පැමිණිල්ල ඉදිරිපත් කර ප.ව. 8.15ට පමණ නිවසට පැමිණි බවත්, පසුව 2023.11.06 වන දින පිටිගල පොලිස් ස්ථානය වෙත පැමිණෙන ලෙස දැනුම්දුන් බවත්, ඒ අනුව ඇල්පිටිය සහකාර පොලිස් අධිකාරීවරයා විසින් තමාගේ මවට විරුද්ධව පුංචි අම්මලා විසින් 2023.10.16 දින ඉදිරිපත් කරන ලද පැමිණිල්ල, තමා විසින් පුංචි අම්මලාට විරුද්ධව 2023.10.25 දින ඉදිරිපත් කරන ලද පැමිණිල්ල සහ පුංචි අම්මලා සමඟ තමාගේ නිවස වෙත පැමිණ සිටි නීතිඥ මහත්මිය විසින් යොමු කර තිබූ ලිඛිත පැමිණිල්ල 2023.11.05 දින වන විට පොලිස් ස්ථානය වෙත ලැබී තිබූ බැවින් එකී පැමිණිලි සියල්ල විභාග කළ බවත්, තමා පදිංචිව සිටින නිවස පිළිබඳ ඇති ගැටළුව සම්බන්ධයෙන් පොලිසියට මැදිහත් වීමේ හැකියාවක් නොමැති බව පවසා දිසා අධිකරණයේ නඩුවක් ගොනු කර අයිතිවාසිකම තහවුරු කරගන්නා ලෙස උපදෙස් ලබා දී පැමිණිලි සමථයට පත් කළ බවත්, එදින පුංචි අම්මලා සමඟ 2023.10.25 වන දින තමාගේ නිවස වෙත පැමිණි නීතිඥවරිය ද සිටි නමුත් කිසිදු අවස්ථාවක තමා බැණ වැදුණු බවට ප්‍රකාශයක් නොකළ බවත්, එහිදී තමා විසින් මහේෂිකා යන පොලිස් කාන්තාවට බලපෑම් කළ බවට ද කිසිදු චෝදනාවක් නොකළ බවත්, පිටිගල පොලිස් ස්ථානයේ සිදුවූ සිදුවීම සම්බන්ධයෙන් තමා විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට, ජාතික පොලිස් කොමිෂන් සභාවට සහ පොලිස්පතිවරයාට පැමිණිලි කළ බවත්, එම පැමිණිලිවලට අනුව 2024.01.31 වන දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව යොමු කළ ලිපිය මඟින් තමාට විරුද්ධව අංක 35302 යටතේ ඇල්පිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින බැවින් එම නඩුවේ කටයුතු අවසන් වනතෙක් තමාගේ පැමිණිල්ල බහා තබන බවට දැනුම්දුන් බවත්, එම ලිපිය මඟින් තමාට විරුද්ධව පොලිසිය විසින් නඩුවක් ගොනු කර ඇති බවට දැනගන්නට ලැබුණු බවත්, එම අවස්ථාව වන විට මෙම සිද්ධියට අදාළ ස්ථානාධිපතිවරයා ස්ථාන මාරු වී නව ස්ථානාධිපතිවරයෙක් පැමිණ සිටි බවත්, 2024.10.03 වන දින මෙම නඩුව අධිකරණයේ කැඳවූ අවස්ථාවේදී සාක්ෂි නොමැතිකම සම්බන්ධයෙන් පොලිසිය විසින් අධිකරණයට කරුණු දැක්වීම මත නඩුව ඉල්ලා අස් කර ගන්නා ලද බවත්, ඒ අනුව මෙම සිද්ධියට අදාළ ස්ථානාධිපතිවරයා හා පොලිස් නිලධාරිනී කා.පො.කො.8206 මහේෂිකා විසින් හිතාමතා අසද්භාවයෙන් කටයුතු කරමින් අධිකරණය හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නොමඟ යැවීමට ව්‍යාජ සටහන් යොදා තමාගේ අයිතිවාසිකම් කඩ කිරීමට කටයුතු කර ඇති බවත්, ඒ අනුව එම නිලධාරීන්ට විරුද්ධව නීතිමය පියවර ගන්නා ලෙසත් ඉල්ලා පැමිණිලිකරු විසින් තම ප්‍රකාශය ලබා දී ඇත.

<u>වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

**මෙම සිදුවීම සිදුවන අවස්ථාව වන විට පිටිගල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වශයෙන් කටයුතු කළ පො.ප. ජී.ඒ.ඒ. පුෂ්පකුමාර මහතාගේ ප්‍රකාශය:**

තමා වැඩබලන පොලිස් ස්ථානාධිපති වශයෙන් පිටිගල පොලිස් ස්ථානයේ සේවය කරමින් සිටියදී 2023.10.25 දින සෙම්බකුට්ටි විදානලාගේ චතුර රංගන ද සිල්වා යන අය පැමිණ සිටි මහජනයාට පරුෂ වචන කියමින්, අප්‍රියජනක වචනවලින් බැන වදිමින්, පොලිස් නිලධාරීන්ට ද බැන වදිමින් සාමය කඩවන ආකාරයට හැසිරීම හේතුවෙන් ඔහුට ඇති චෝදනාව පහදා දී උපසේවක කා.පො.කො. 8206 මහේෂිකා විසින් අත්අඩංගුවට ගෙන තිබූ බවත්, කා.පො.කො. 8206 මහේෂිකා විසින් යොදන ලද සටහන් මඟින් සැකකරුගේ හැසිරීම සම්බන්ධයෙන් තහවුරු වන බවත්, අනතුරුව සැකකරු බීමතින් සිටියේද යන්න පරීක්ෂා කිරීම සඳහා අධිකරණ වෛද්‍ය නිලධාරී වෙත යොමු කිරීමෙන් අනතුරුව පොලිස් ස්ථානයට පැමිණි පසුව ඇප මත මුදා හැරීමට කටයුතු කළ බවත්, 2023.11.07 දින මෙම සිද්ධිය සම්බන්ධයෙන් අධිකරණයට කරුණු වාර්තා කිරීම සිදුකළ බවත් ප්‍රකාශ කර ඇත.

**සැකකරු අත්අඩංගුවට ගැනීම සිදුකළ කා.පො.කො. 8206 මහේෂිකා මියගේ ප්‍රකාශය:**

2023.10.25 දින තමා උපසේවා රාජකාරියේ යෙදී සිටියදී ප.ව. 3.10ට පමණ පැමිණිලිකරු පොලිස් ස්ථානය වෙත පැමිණ සුනීතා රංජනී කිරිඇල්ල, සුවිනීතා පද්මිණී කල්දේරා, මදූකා සනාතනී කිරිඇල්ල සහ චම්පා සන්ධ්‍යා කිරිඇල්ල යන කාන්තාවන් සිව්දෙනාට පරුෂ වචනයෙන් අප්‍රියජනක ආකාරයෙන් බැන වැදුණු බවත්, එම අවස්ථාවේදී තමා සැකකරුට අවවාද කළ බවත්, පැමිණිලිකරු බීමතින් සිටින බවට තමාට වැටහුණු බැවින් ස්ථානාධිපතිතුමා දැනුවත් කර, ස්ථානාධිපතිතුමාගේ උපදෙස් පරිදි වරද කියා දී අත්අඩංගුවට ගෙන අධිකරණ වෛද්‍ය නිලධාරී වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ බවත්, පැමිණිලිකරු තමාට බලපෑමක් හෝ රාජකාරි කටයුතුවලට බාධා කිරීමක් සිදුනොකළ බවත්, එම ස්ථානයේ සිටි අනෙක් තැනැත්තන්ට අප්‍රියජනක වන අන්දමින් බැන වැදුණු බවත්, තමාගේ රාජකාරි කටයුතුවලට බාධා කළ බවට බී වාර්තාවේ සටහන් කර තිබීම අත්වැරදීමකින් සිදුවන්නට ඇති බවට ප්‍රකාශ කර ඇත.

**සැකකරු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් 2023.11.07 දින බී වාර්තාවක් මඟින් ඇල්පිටිය මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කළ පිටිගල පොලිස් ස්ථානයේ උ.පො.ප. වික්‍රමසිංහ මහතාගේ ප්‍රකාශය:**

තමා මේ වන විට මීටියාගොඩ පොලිස් ස්ථානයට අනුයුක්තව පොලිස් පරීක්ෂකවරයෙකු වශයෙන් රාජකාරි කරන බවත්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කර ඇති චතුර රංගන ද සිල්වා යන අය 2023.10.25 දින පිටිගල පොලිස් ස්ථානයේ චෝදනාගාරයේ අශෝභන ලෙස හැසිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීම පිළිබඳව තමා දැනුවත් නොමැති බවත්, එම සිදුවීම සම්බන්ධයෙන් අධිකරණයට කරුණු වාර්තා කිරීමේදී ඉදිරිපත් කළ 2023.11.07 දිනැති බී වාර්තාවට තමා විසින් අත්සන යොදන අවස්ථාවේදී මෙම සිදුවීම සම්බන්ධයෙන් දැනුවත් වූ බවත්, 2023.11.07 දින ඇල්පිටිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිතුමා ස්ථානයෙන් බැහැරව සිටි බැවින් වැඩ බලන ස්ථානාධිපතිවරයා වශයෙන් කටයුතු කළ තමා විසින් සද්භාවයෙන් යුතුව අදාළ බී වාර්තාව සඳහා අත්සන් කළ බවත්, එම බී වාර්තාව තමා වෙත ඉදිරිපත් කළ නඩු මෙහෙයුම් අංශයේ නිලධාරින්ගෙන් මෙම සිදුවීම සම්බන්ධයෙන් විමසූ බවත්, එහිදී සඳහන් කළ ආකාරයට සැකකරු බීමත්ව අශෝභන ලෙස හැසිරෙමින් චොදනාගාරයේ රාජකාරිවලට බාධාවන අයුරින් කටයුතු කළ බැවින් සැකකරු අත්අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කර ඇති බවත්, සැකකරු වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර කෙටි වෛද්‍ය වාර්තාවක් ලබාගෙන ඇති බවත්, එහි බීමත්ව නොමැති බවට සටහන් කර ඇති බවත්, 2023.10.25 වන දින සැකකරු සහ තවත් පාර්ශවයක් පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් විභාග කිරීම සඳහා පැමිණ ඇති බවත්, ඔවුන් හට ද පරුෂ වචන කියමින් බැන වැදී ඇති බවට ප්‍රකාශ සටහන් කර ඇති බව දැනුවත් වූ බවත්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ල ඉදිරිපත් කර ඇති පැමිණිලිකරු තමා නොහඳුනන බවත්, එම පැමිණිලිකරු සම්බන්ධව තමාගේ කිසිදු පුද්ගලික තරහක් හෝ පළිගැනීමක් නොමැති බවත් ප්‍රකාශ කර ඇත.

<u>අධිකරණ වෛද්‍ය වාර්තාව මඟින් අනාවරණය වන කරුණු</u>

අධිකරණ වෛද්‍ය නිලධාරී ඩිලාන් පරණමාන විසින් සැකකරු බීමතින් සිටින්නේද යන්න සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා ඇත. සැකකරු බීමතින් සිට නොමැති බවටත්, ඔහුගෙන් මත්පැන් ගඳ වහනය නොවන බවටත් අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි දක්වා ඇත.

<u>නිරීක්ෂණ</u>

පිටිගල පොලිස් ස්ථානයේ විවිධ පැමිණිලි තොරතුරු සටහන් පොතෙන් උපුටා ගන්නා ලද උධෘතවලට අනුව, 2023.10.16 දින පැය 1600ට CIB (05) 262/112 යටතේ සුනීතා රංජනී කිරිඇල්ල යන අය විසින් ඉඩම් ආරවුලක් සම්බන්ධයෙන් පිටිගල පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. එකී පැමිණිල්ලට අනුව, සුනීතා රංජනී කිරිඇල්ල යන අයට සහෝදරියන් 6 දෙනෙක් සහ එක් සහෝදරයෙක් සිටින බවත්, තමාගේ එකම සහෝදරයා වන අනුරාධ ලලිත් කිරිඇල්ල යන අය පදිංචිව

සිටි කනත්ත වත්ත, අමුගොඩ ලිපිනයේ රබර් මෝල අසල පර්චස් 7 1/2ක සින්නක්කර ඉඩමක් තිබෙන බවත්, එහි ඉදිකර ඇති නිවසේ එක් තට්ටුවක වැඩ අවසන් කර ඇති බවත්, තම සහෝදරයා 2019.01.26 දින මියයාමෙන් පසුව තමාගේ සහෝදරියක වන පත්මා කිරිඇල්ල යන අය නිවස කුලියට දී බලා කියාගෙන සිටි නමුත් සහෝදරයා මියයාමෙන් පසුව දානමය පිංකමක් හෝ සිදුනොකළ බවත්, තම සහෝදරයා මිය යන විට නිවස හෝ ඉඩම කිසිදු තැනැත්තෙකුගේ නමට ලියා නොතිබුණ බවත්, තමාගේ සහෝදරියක වන පත්මා කිරිඇල්ල යන අය විසින් ඇයගේ පුත්‍රයාට නිවස සහ ඉඩම ලබාදීම සම්බන්ධයෙන් සහෝදරියන් සියලුදෙනාම විරුද්ධ වන බවත්, ඒ අනුව පත්මා කිරිඇල්ල යන අයගේ ස්වාමිපුරුෂයා වන විමලසිරි සිල්වා යන අය ගෙන්වා එම නිවසේ කිසිදු පුද්ගලයෙක් පදිංචි නොකර සිටීමට අවවාද කරන ලෙසත්, අධිකරණයේ නඩු පවරා සාධාරණයක් කර දෙන තුරු නිවසට හා ඉඩමට ඇතුළු නොවන ලෙසට අවවාද කරන ලෙසත් ඉල්ලා ඇත.

පිටිගල පොලිස් ස්ථානයේ විවිධ පැමිණිලි තොරතුරු සටහන් 04 පොතේ පිටු අංක 303හි ඡේද අංක 134 යටතේ 2023.10.21 දින පැය 1615ට යොදා ඇති සටහන්වලට අනුව, එකී පැමිණිල්ල සම්බන්ධයෙන් දැනුම්දීම සඳහා 2023.10.21 දින පැය 1010ට පො.සැ. 62917 පියන්කර නිලධාරියා ගොස් ඇති අතර, පත්මා කිරිඇල්ල සහ විමලසිරි සිල්වා යන අයට පැමිණිල්ල සම්බන්ධයෙන් දැනුම් දී ඇත. මෙම පැමිණිල්ල විභාග කිරීම සඳහා 2023.10.25 දින දෙපාර්ශවය පොලිස් ස්ථානය වෙත කැඳවා ඇතත් සුනීතා රංජනී කිරිඇල්ල යන අය පමණක් පොලිස් ස්ථානය වෙත පැමිණ ඇති බවත්, පත්මා කිරිඇල්ල, විමලසිරි ද සිල්වා සහ රංගන ද සිල්වා යන අය පොලිස් ස්ථානය වෙත පැමිණ නොමැති බවත් පිටිගල පොලිස් ස්ථානයේ විවිධ පැමිණිලි තොරතුරු සටහන් 05 පොතේ පිටු අංක 311හි ඡේද අංක 163 යටතේ යොදා ඇති සටහන් අනුව නිරීක්ෂණය වේ.

ඒ අනුව, සුනීතා රංජනී කිරිඇල්ල යන අය විසින් 2023.10.25 දින පැය 1200ට නිවසේ ඉබි යතුරු දැමීම සම්බන්ධව නැවත ප්‍රකාශයක් කරමින් සඳහන් කර ඇත්තේ, තමාගේ නැගණිය වන පත්මා කිරිඇල්ල යන අයට එරෙහිව 2023.10.16 දින පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කළ පැමිණිල්ල විභාග කිරීම සඳහා 2023.10.25 දින කැඳවන ලද නමුත් ඔවුන් පැමිණ නැති බවත්, තමාගේ සන්තකයේ තම සහෝදරයාගේ නිවසේ යතුර ඇති බැවින් එම නිවසට රංගන යන අයට ඇතුළු වීමට නොහැකි වන පරිදි නිවසේ ඉදිරිපස ඉබි යතුරු දැමීමට කටයුතු කරන බවත්, දේපල සම්බන්ධයෙන් දිසා අධිකරණයේ බූදල් නඩුවක් දැමීමට කටයුතු කරන බවත් ය.

කෙසේනමුත් 2023.10.16 දින CIB (05) 262/112 යටතේ සුනීතා රංජනී කිරිඇල්ල යන අය විසින් ගොනු කර ඇති පැමිණිල්ලෙහි රංගන ද සිල්වා යන අය සම්බන්ධයෙන් කිසිදු සඳහන් කිරීමක් සිදුකර

නොමැති අතර, අදාළ පැමිණිල්ලෙහි සඳහන් කර ඇත්තේ පත්මා කිරිඇල්ල සහ විමලසිරි ද සිල්වා යන සම්බන්ධයෙන් පමණි. එමෙන්ම එකී පැමිණිල්ල 2023.10.25 දින විභාග කරන බවට දැනුම්දීම සිදුකර ඇත්තේ, පත්මා කිරිඇල්ල සහ විමලසිරි ද සිල්වා යන අය වෙත පමණක් වන අතර, රංගන ද සිල්වා යන අය වෙත කිසිදු දැනුම්දීමක් සිදුකර නොමැත. කරුණු එසේ තිබියදී ප්‍රශ්නගත නිවසට රංගන ද සිල්වා යන අයට ඇතුළු වීමට නොහැකි වන පරිදි ඉබි යතුරු දැමීමට කටයුතු කරන බවට සඳහන් කරමින් සුනීතා රංජනී කිරිඇල්ල යන අය විසින් 2023.10.25 දින නැවත ප්‍රකාශයක් සිදුකර ඇත. එම අවස්ථාවේදී හෝ මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් රංගන ද සිල්වා යන අය දැනුවත් කළ යුතුව තිබූ නමුත් පිටිගල පොලිස් ස්ථානයේ නිළධාරීන් ඒ සඳහා කටයුතු කර නොමැති බවට නිරීක්ෂණය වේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කර ඇති චතුර රංගන ද සිල්වා යන අය මෙම කොමිෂන් සභාව හමුවේ පෙනී සිටිමින් ලබා දී ඇති ප්‍රකාශය අනුව, 2023.10.25 වන දින පැමිණිලිකරු රැකියා ස්ථානයට ගොස් සිටියදී ප.ව.12ත් 12.30ත් අතර ඉන්දික යන අය පැමිණ තමාගේ පුංචි අම්මලා නිවසට ඇතුළු වීමට උත්සාහ දරන බවට තමාට දැනුම්දුන් බවත්, තමාගේ නිවස පයින් ඇවිද යා හැකි දුරක පිහිටා ඇති බැවින් තමා රැකියා ස්ථානයෙන් පිටව නිවස බලා ගිය බවත්, එම අවස්ථාවේදී පොලිස් නිලධාරීන් දෙදෙනෙක් පාරේ සිටින බවට තමා දුටු බවත්, තමා නිවස අසලට යන විට තමාගේ පුංචි අම්මලා තිදෙනා සහ නීතිඥ මහත්මියක් නිවසේ දොර විවෘත කිරීමට උත්සාහ කරමින් සිටින බවට දුටු බවත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව, සුනීතා රංජනී කිරිඇල්ල යන අය විසින් 2023.10.25 දින පැය 1200ට නිවසේ ඉබි යතුරු දැමීම සම්බන්ධව පොලිස් ස්ථානයේ නැවත ප්‍රකාශයක් සටහන් කිරීමෙන් අනතුරුව පැමිණිලිකරු පදිංචි ස්ථානය වෙත ගොස් ඇති බවට පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පෙනී සිටිමින් ලබා දී ඇති ප්‍රකාශය අනුව තහවුරු වේ.

කරුණු මෙසේ තිබියදී පැමිණිලිකරුගේ පුංචි අම්මලා තිදෙනා සහ නීතිඥ මහත්මිය නිවසට ඇතුළු වීමට උත්සාහ දැරීම සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා පිටිගල පොලිස් ස්ථානය වෙත ගිය අවස්ථාවේදී පැමිණිලිකරු අත්අඩංගුවට ගන්නා ලද බවට පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත.

පිටිගල පොලිස් ස්ථානයේ සංචාරක තොරතුරු සටහන් පොතේ පිටු අංක 247හි ඡේද අංක 310 අනුව, 2023.10.25 දින පැය 1530ට පිටිගල පොලිස් ස්ථානයේ උපසේවා රාජකාරියේ යෙදී සිටි කා.පො.කො. 8206 මහේෂිකා විසින් පොලිස් ස්ථානයට පැමිණ සිටි පුද්ගලයෙකු වන නානායක්කාර වසම් සෙම්බකුට්ටි විදානලාගේ චතුර රංගන ද සිල්වා හෙවත් මෙම පැමිණිලිකරු පොලිස් ස්ථානයේ විවිධ රාජකාරි කර ගැනීම සඳහා පැමිණ සිටි මහජනතාව ඉදිරියේ පරුෂ වචන කියමින්, පොලිස් නිලධාරීන්ට හා පැමිණිලි විභාග කිරීමට පැමිණි කාන්තාවන් කිහිපදෙනෙකුට බැන වදිමින්, පැමිණ

සිටි මහජනතාවට අප්‍රියජනක වචනවලින් බැන අඩ ගසමින් හැසිරුණු බැවින් එම පුද්ගලයාට එම ස්ථානයෙන් පිටව යන ලෙසට දැනුම්දුන් නමුත් ඒ බව තේරුම් ගැනීමටවත් සිහිකල්පනාවකින් නොසිටි බැවින් බීමත්ව අශෝභන ලෙස හැසිරීමේ වරද කියා දී පැය 1510ට සැකකරු අත්අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කර ඇත.

කෙසේනමුත් පැමිණිලිකරු බීමතින් නොසිටි බවට අධිකරණ වෛද්‍යවරයා විසින් තහවුරු කර ඇත. එමෙන්ම පැමිණිලිකරු පොලිස් ස්ථානයේ විවිධ රාජකාරි කර ගැනීම සඳහා පැමිණ සිටි මහජනතාව ඉදිරියේ පරුෂ වචන කියමින්, පොලිස් නිලධාරීන්ට හා පැමිණිලි විභාග කිරීමට පැමිණි කාන්තාවන් කිහිපදෙනෙකුට බැන වදිමින්, පැමිණ සිටි මහජනතාවට අප්‍රියජනක වචනවලින් බැන අඩ ගසමින් හැසිරුණු බවට සඳහන් කරමින් කා.පො.කො. 8206 මහේෂිකා විසින් පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇතත් එවැනි ආකාරයේ බැන වැදීමක් සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක් 2023.10.25 දින හෝ ඊට ආසන්න දිනයක පොලිස් ස්ථානය වෙත ඉදිරිපත්ව නොමැති බවට නිරීක්ෂණය වේ. පැමිණිලිකරු පරුෂ වචනයෙන් බැන වැදුනු බවට සඳහන් කරමින් මුල්වරට පැමිණිල්ලක් යොමු කර ඇත්තේ, සුවිනීතා පද්මිණී කල්දේරා හෙවත් පැමිණිලිකරුගේ පුංචි අම්මලා සමඟ පැමිණිලිකරුගේ නිවසට පැමිණි නීතිඥවරිය වන අතර, ඇය විසින් පොලිස් ස්ථානය වෙත පැමිණ පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම වෙනුවට ලියාපදිංචි තැපෑලෙන් ලිඛිත පැමිණිල්ලක් යොමු කර ඇති බව නිරීක්ෂණය වේ. එම ලිඛිත පැමිණිල්ල 2023.11.05 දින, එනම් සිදුවීමෙන් දින 11කට පමණ පසුව විවිධ පැමිණිලි තොරතුරු සටහන් පොතේ අලවා ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය වේ.

> ***නමසිවායම් එදිරිව ගුණවර්ධන* [1989 01 SLR 394]** නඩුවේදී ගරු ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇත්තේ, පොලිස් නිලධාරීන්ගේ බලය අසීමිත නොවන බවත්, නීත්‍යානුකූල හා සාධාරණ පදනමක් නොමැතිව සිදුකරන අත්අඩංගුවට ගැනීමක් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් වන බවත් ය.

ඒ අනුව, මෙම ප්‍රශ්නගත කාරණයේදී 2023.10.25 දින පැය 1510ට පිටිගල පොලිස් ස්ථානයේදී කා.පො.කො. 8206 මහේෂිකා නිලධාරිනිය විසින් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම නීත්‍යානුකූල හා සාධාරණ පදනමක් නොමැතිව සිදුකරන ලද අත්අඩංගුවට ගැනීමක් බව නිරීක්ෂණය වේ.

තවද 2023.10.25 දින සැකකරු අත්අඩංගුවට ගෙන ඇතත් මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ඇල්පිටිය මහේස්ත්‍රාත් අධිකරණය වෙත මුල් වරට කරුණු වාර්තා කර ඇත්තේ, 2023.11.07 දින වන අතර, එනම් මෙම සිදුවීමෙන් දින 13කට පසුව බව නිරීක්ෂණය වේ. තවද එලෙස අධිකරණයට කරුණු වාර්තා කිරීමේදී 2023.11.07 දින පිටිගල පොලිස් ස්ථානයේ වැඩබලන ස්ථානාධිපතිවරයා වශයෙන් කටයුතු කළ උ.පො.ප. වික්‍රමසිංහ මහතා විසින් බී වාර්තාවට අත්සන් තබා ඇති බව වැඩිදුරටත්

නිරීක්ෂණය විය. එකී බී වාර්තාවේ සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරු විසින් කා.පො.කො. 8206 මහේෂිකා නිලධාරිනිය හට සාපරාධී බලහත්කාරය පෑ බවයි. කෙසේනමුත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පැවති පරීක්ෂණයේදී කා.පො.කො. 8206 මහේෂිකා නිලධාරිනිය සඳහන් කර ඇත්තේ, මෙම පැමිණිලිකරු තමාට බලපෑමක් හෝ රාජකාරි කටයුතුවලට බාධා කිරීමක් සිදුනොකළ බවත්, එම ස්ථානයේ සිටි අනෙක් තැනැත්තන්ට අප්‍රියජනක වන අන්දමින් බැන වැදුණු බවත් ය. තවද තමාගේ රාජකාරී කටයුතුවලට බාධා කළ බවට බී වාර්තාවේ සටහන් කර තිබීම අත්වැරදීමකින් සිදුවන්නට ඇති බවත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව බී වාර්තාවෙහි සඳහන් කරුණු සහ කා.පො.කො. 8206 මහේෂිකා කොමිෂන් සභාව හමුවේ පෙනී සිටිමින් ලබා දී ඇති ප්‍රකාශය එකිනෙකට පරස්පර වන බව නිරීක්ෂණය වේ.

තවද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පැවති පරීක්ෂණයේදී එවකට පිටිගල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වශයෙන් කටයුතු කළ පො.ප. ජී.ඒ.ඒ. පුෂ්පකුමාර මහතා සඳහන් කර ඇත්තේ, කා.පො.කො. 8206 මහේෂිකා නිලධාරිනිය විසින් සැකකරුගේ හැසිරීම සලකා ඔහු අත්අඩංගුවට ගැනීමට කටයුතු කළ බවයි. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පැවති පරීක්ෂණයේදී කා.පො.කො. 8206 මහේෂිකා නිලධාරිනිය විසින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරු බීමතින් අශෝභන ලෙස හැසිරෙන බවට තමා විසින් ස්ථානාධිපතිවරයා දැනුවත් කළ බවත්, ඉන් අනතුරුව ඔහු විසින් ලබාදුන් උපදෙස් පරිදි සැකකරු අත්අඩංගුවට ගැනීමට කටයුතු කළ බවයි. කෙසේනමුත් පිටිගල පොලිස් ස්ථානයේ සංචාරක තොරතුරු සටහන් පොතේ පිටු අංක 247හි ඡේද අංක 310 අනුව, කා.පො.කො. මහේෂිකා නිලධාරිනිය විසින් සැකකරු අත්අඩංගුවට ගැනීමට පෙර ස්ථානාධිපතිවරයාගෙන් උපදෙස් විමසීමක් සිදුකර නොමැති බවට නිරීක්ෂණය වේ.

පිටිගල පොලිස් ස්ථානයේ සංචාරක තොරතුරු සටහන් පොතෙන් උපුටා ගන්නා ලද උධෘතවලට අනුව, 2023.10.25 දින ස්ථානාධිපතිතුමාගේ නියෝග හා උපදෙස් පරිදි වෛද්‍ය පෝරම අංක 110/23 නිකුත් කර, සැකකරු වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම සඳහා පැය 1630ට පො.සැ. 58469 ආනන්ද නිලධාරියා සහ පො.සැ. 1614 ක්‍රිශාන්ත නිලධාරියා විසින් පදවන ලද අංක ABV 1710 දරණ ත්‍රීරෝද රථයෙන් ඇල්පිටිය මූලික රෝහලට පිටව ගොස් ඇත. සැකකරු වෛද්‍ය ඩිලාන් පරනමාන විසින් පරීක්ෂා කර බලා ඇති අතර, එහිදී සැකකරු බීමතින් නොමැති බවට වෛද්‍යවරයා විසින් සටහන් කර ඇත. පැය 1800ට නැවත පොලිස් ස්ථානය වෙත පැමිණ සැකකරු උපසේවක පො.කො. 104306 මධුශංක නිලධාරියා වෙත භාර දීමට කටයුතු කර ඇත. 2023.10.25 දින පැය 1830ට සැකකරුගේ ප්‍රකාශය සටහන් කර ගැනීම සිදුකර ඇත. ඒ අනුව, තමා ව්‍යාපාර ස්ථානයට ගොස් නැවත එනවිට තම ඥාතීන් වන මධුකා කිරිඇල්ල, සන්ධ්‍යා කිරිඇල්ල, සුනීතා කිරිඇල්ල හා තවත් අයෙක් තමා දැනට පදිංචිව සිටින නිවසට ඇතුල්වීමට උත්සාහ කරමින් සිටි බවත්, තමා මේ

සම්බන්ධයෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට පොලිස් ස්ථානයට පැමිණි පසුව පැමිණිල්ල විභාග කරන අවස්ථාවේදී බීමතින් සිටින බවටත් සාමය කඩවන ආකාරයට හැසිරුණ බවටත් වරද කියා දී තමා අත්අඩංගුවට ගත් බවට සැකකරුගේ ප්‍රකාශය සටහන් කරගෙන ඇත. අනතුරුව 2023.10.25 දින පැය 1910ට ස්ථානාධිපතිතුමාගේ නියෝග හා උපදෙස් පරිදි රාත්‍රී උපසේවක පො.කො. 104306 මධුශංක විසින් එක් ශරීර ඇපයක් මත පොලිස් ස්ථානයෙන් දැනුම්දුන් විටෙක ඉදිරිපත් කිරීමට උපදෙස් ලබාදෙමින් ඇප ලබා දීමට කටයුතු කර ඇත.

පැමිණිලිකරු ඇප මත මුදා හැරීමෙන් අනතුරුව ඔහු සම්බන්ධයෙන් පිටිගල පොලිස් ස්ථානය වෙත ලිඛිත පැමිණිලි ලැබුණු බවට වගඋත්තර පාර්ශවය විසින් උධෘත සටහන් ඉදිරිපත් කරමින් කරුණු දක්වා ඇත. ඒ අනුව, පිටිගල පොලිස් ස්ථානයේ විවිධ පැමිණිලි තොරතුරු සටහන් පොතෙන් උපුටා ගන්නා ලද උධෘතවලට අනුව, 2023.10.25 දින පැමිණිලි විභාග කිරීම සඳහා පොලිස් ස්ථානය වෙත පැමිණ සිටි සුවිනීතා පද්මිණී කල්දේරා යන අය විසින් යොමු කර ඇති ලිඛිත පැමිණිල්ල 2023.11.05 දින පැය 1030ට විවිධ පැමිණිලි තොරතුරු සටහන් පොතේ අලවා ඇත. එම පැමිණිල්ල මඟින් දක්වා ඇත්තේ, පිටිගල පොලිස් ස්ථානය තුළදී රංගන ද සිල්වා යන අය විසින් බීමතින් පොලිස් ස්ථානය තුළදී තමාට බැන වැදී අසභ්‍ය ලෙස හැසිරීම හේතුවෙන් මෙම පැමිණිල්ල සටහන් කරන බවත්, 2023.10.25 දින තම පැමිණිල්ල විභාග කිරීම සඳහා පොලිස් ස්ථානයට පැමිණ සිටි අවස්ථාවේදී සවස 3ට පමණ රංගන ද සිල්වා යන අය පොලිස් ස්ථානය වෙත පැමිණ එදින තමා විසින් පොලිස් ස්ථානයේ ගොනු කරන ලද පැමිණිල්ලකට තමා සම්බන්ධ බවට දැන අසභ්‍ය වචනයෙන් බැන වැදුණු බවත්, එම අවස්ථාවේ පොලිස් ස්ථානයේ රාජකාරියේ යෙදී සිටි කා.පො.කො. 8206 මහේෂිකා විසින් රංගන ද සිල්වා යන අයට නිශ්ශබ්ද වන ලෙසට දැනුම්දුන් බවත්, මෙම නිලධාරිනිය මෙම සිදුවීම සම්බන්ධයෙන් ස්ථානාධිපතිවරයා වාචිකව දැනුවත් කළ බවත්, තමා අධික පීඩාවෙන් සිටි බැවින් පසුව ලිඛිත පැමිණිල්ලක් යොමු කරන ලෙස තමාට දැනුම්දුන් බවත්, තමා ප.ව.4ට පමණ පොලිස් ස්ථානයෙන් පිටවූ බවත් ය. අනතුරුව සුවිනීතා පද්මිණී කල්දේරා යන අය විසින් යොමු කරන ලද පැමිණිල්ලට අදාළව සුනීතා රංජනී කිරිඇල්ල, මධූකා සනාතනී කිරිඇල්ල සහ චම්පානි සන්ධ්‍යා කිරිඇල්ල යන අය විසින් සැකකරුට එරෙහිව තැපැල් මඟින් යොමු කර තිබූ ලිඛිත පැමිණිලි 2023.11.11 දින පැය 1300ට කා.පො.කො. 8206 මහේෂිකා විසින් විවිධ පැමිණිලි තොරතුරු සටහන් පොතේ අලවා ඇත.

2023.10.16 දින CIB (05) 262/112 යටතේ සුනීතා රංජනී කිරිඇල්ල යන අය විසින් ගොනු කර තිබූ පැමිණිල්ල විභාග කිරීම සඳහා 2023.10.25 දින දෙපාර්ශවය පිටිගල පොලිස් ස්ථානය වෙත කැඳවා ඇත. එදින සුනීතා රංජනී කිරිඇල්ල යන අය සමඟ මධූකා සනාතනී කිරිඇල්ල, චම්පානි සන්ධ්‍යා කිරිඇල්ල සහ නීතිඥවරියක වන සුවිනීතා පද්මිණී කල්දේරා යන අය ද පැමිණ ඇත. ඒ අනුව, චතුර

රංගන ද සිල්වා යන අය බීමතින් බැන වැදුන බවට ලිඛිත පැමිණිලි ඉදිරිපත් කර ඇත්තේ මෙම කාන්තාවන් විනා වෙනත් බාහිර පාර්ශවයක් නොවන බවට නිරීක්ෂණය වේ.

එමෙන්ම 2023.10.25 දින සිදුවූ සිදුවීමක් සම්බන්ධයෙන් එම දිනයේදීම හෝ දින කිහිපයක් ඇතුළත පොලිස් ස්ථානය වෙත පැමිණ පැමිණිලි ඉදිරිපත් කිරීමකින් තොරව තැපැල් මඟින් පැමිණිලි ඉදිරිපත් කර ඇති බවට නිරීක්ෂණය වන අතර, සුවිනීතා පද්මිණී කල්දේරා යන අය විසින් යොමු කර ඇති ලිඛිත පැමිණිල්ල 2023.11.05 දින, එනම් සිදුවීමෙන් දින 11කට පමණ පසුව විවිධ පැමිණිලි තොරතුරු සටහන් පොතේ අලවා ඇත. සුනීතා රංජනී කිරිඇල්ල, මධුකා සනාතනී කිරිඇල්ල සහ චම්පානි සන්ධ්‍යා කිරිඇල්ල යන අය විසින් සැකකරුට එරෙහිව තැපැල් මඟින් යොමු කර තිබූ ලිඛිත පැමිණිලි 2023.11.11 දින, එනම් සිදුවීමෙන් දින 17කට පමණ පසුව විවිධ පැමිණිලි තොරතුරු සටහන් පොතේ අලවා ඇති බව නිරීක්ෂණය වේ.

සැකකරුට එරෙහිව ඉදිරිපත්ව තිබූ පැමිණිලි හේතුවෙන් එකී පැමිණිලිකාරියන්ට මෙවැනි අපහාසාත්මක බැන වැදීම් දිගින් දිගටම මෙම සැකකරු විසින් සිදුකරන්නේද යන්න පිළිබඳව විමර්ශන පවත්වා ප්‍රගතිය වාර්තා කිරීමට ස්ථානාධිපතිවරයා විසින් 2023.12.14 දිනැතිව අධිකරණය වෙත වැඩිදුර වාර්තාවක් ඉදිරිපත් කරමින් ඉදිරි දිනයකදී නඩුව කැඳවන ලෙස ඉල්ලා ඇති බව 2023.12.14 දිනැතිව අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද වැඩිදුර වාර්තාව අනුව නිරීක්ෂණය වේ. ඒ අනුව ඇල්පිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වූ අංක 35302 දරණ නඩුවට කරුණු ඉදිරිපත් කරමින් සැකකරුට විරුද්ධව ඉන්පසු කිසිවක් පැමිණිලි නොලැබීම සහ තවදුරටත් නඩුව පවත්වාගෙන යාමේ අදහසක් නොමැති වීම හේතුවෙන් 2024.10.03 දින නඩුව කැඳවූ අවස්ථාවේදී එවකට පිටිගල පොලිස් ස්ථානයේ නව ස්ථානාධිපතිවරයා වශයෙන් කටයුතු කළ පො.ප. අර්ජුන වික්‍රමසිංහ විසින් එම නඩුව ඉල්ලා අස්කර ගෙන ඇත. ඒ අනුව සැකකරු මුදාහැරීමට කටයුතු කර ඇත.

තවද පිටිගල පොලිස් ස්ථානයේ විවිධ පැමිණිලි තොරතුරු සටහන් පොතෙන් උපුටා ගන්නා ලද උධෘතවලට අනුව, පැමිණිලිකරු 2023.10.25 දින, එනම් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සිදුවූ දිනයේදී තමාගේ නිවසට අයුතු ලෙස ඇතුල්වීමට උත්සාහ දැරූ ඥාතීන්ට එරෙහිව පිටිගල පොලිස් ස්ථානයේ ගොනු කරන ලද පැමිණිල්ල සහ එම ඥාතීන් පිරිස විසින් පැමිණිලිකරුගේ මවට සහ පියාට එරෙහිව 2023.10.16 දින ගොනු කර තිබූ පැමිණිල්ල 2023.11.06 දින පැය 1250ට ඇල්පිටිය සහකාර පොලිස් අධිකාරී විසින් මෙහෙයවා, ඉඩම් ආරවුල සම්බන්ධයෙන් සිවිල් අධිකරණයේ නඩු පවරා විසඳා ගැනීමට උපදෙස් ලබාදෙමින් දෙපාර්ශවය සමථයට පත් කර ඇත.

තවද රංගන ද සිල්වා නොහොත් පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පෙනී සිටිමින් සිදුකර ඇති ප්‍රකාශයට අනුව, ඇල්පිටිය සහකාර පොලිස් අධිකාරීවරයා විසින් තමාගේ මවට සහ පියාට විරුද්ධව පුංචි අම්මලා විසින් 2023.10.16 දින ඉදිරිපත් කරන ලද පැමිණිල්ල, තමා විසින් පුංචි අම්මලාට විරුද්ධව 2023.10.25 දින ඉදිරිපත් කරන ලද පැමිණිල්ල සහ පුංචි අම්මලා සමඟ තමාගේ නිවස වෙත පැමිණ සිටි නීතිඥ මහත්මිය වූ සුවිනීතා පද්මිණී කල්දේරා යන අය විසින් යොමු කර තිබූ ලිඛිත පැමිණිල්ල 2023.11.05 දින වන විට පොලිස් ස්ථානය වෙත ලැබී තිබූ බැවින් එකී පැමිණිලි සියල්ල 2023.11.06 දින විභාග කර සමථයට පත් කර ඇත. කරුණු එසේ තිබියදී ස්ථානාධිපතිවරයා විසින් සහකාර පොලිස් අධිකාරීවරයා ද අභිබවා යමින් රංගන ද සිල්වා යන අය සම්බන්ධයෙන් ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇති බව නිරීක්ෂණය වේ.

මෙම සිදුවීමට අදාළව පැමිණිලිකරු විසින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, කොමිෂන් සභාවේ දකුණු පළාත් කාර්යාලය මඟින් විමර්ශනයක් සිදුකර, පිටිගල පොලිස් ස්ථානයේ කා.පො.කො. මහේෂිකා සහ පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ (මෙම සිදුවීම සිදුවන අවස්ථාව වන විට උ.පො.ප. වික්‍රමසිංහ) යන නිලධාරීන් විනය විරෝධී ආකාරයෙන් ක්‍රියා කර ඇති බවට අනාවරණය වන බැවින් එම නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරන ලෙස ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, දකුණු පළාත වෙත දන්වා යවා ඇති බවට ජාතික පොලිස් කොමිෂන් සභාවේ දකුණු පළාත් අධ්‍යක්ෂ විසින් පැමිණිලිකරු අමතා යොමු කර ඇති අංක NPC/PCID/SP/GL/181/23 හා 2025.11.25 දිනැති ලිපිය අනුව නිරීක්ෂණය වේ. එමෙන්ම එකී ලිපියේ වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ, හිටපු වැඩ බලන ස්ථානාධිපති පො.ප. අර්ජුන වික්‍රමසිංහ මහතා ද විනය විරෝධී ආකාරයෙන් ක්‍රියා කර ඇති බවට අනාවරණය වන බවයි. කෙසේනමුත් මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගත් කාලවකවානුවේදී පිටිගල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වශයෙන් කටයුතු කර ඇත්තේ පො.ප. ජී.ඒ.ඒ. පුෂ්පකුමාර මහතා වන බැවින් මෙම සිදුවීමට පො.ප. අර්ජුන වික්‍රමසිංහ මහතාගේ සම්බන්ධතාවයක් නොමැති බවට ජාතික පොලිස් කොමිෂන් සභාව දැනුවත් කිරීමට කටයුතු කර ඇති බව පැමිණිලි පාර්ශවය විසින් පරීක්ෂණය අවස්ථාවේදී සඳහන් කර ඇත.

<u>නිගමනය</u>

1. වගඋත්තර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති උධෘතවලට අනුව, පැමිණිලිකරු 2023.10.25 දින පිටිගල පොලිස් ස්ථානයේ විවිධ රාජකාරි කර ගැනීම සඳහා පැමිණ සිටි මහජනතාව ඉදිරියේ පරුෂ වචන කියමින්, පොලිස් නිලධාරීන්ට හා පැමිණිලි විභාග කිරීමට පැමිණි කාන්තාවන් කිහිපදෙනෙකුට බැන වදිමින්, පැමිණ සිටි මහජනතාවට අප්‍රියජනක වචනවලින් බැන අඬ ගසමින් හැසිරුණු බැවින් එම පුද්ගලයාට එම ස්ථානයෙන් පිටව යන ලෙසට

දැනුම්දුන් නමුත් ඒ බව තේරුම් ගැනීමටවත් සිහිකල්පනාවකින් නොසිටි බැවින් බීමත්ව අශෝභන ලෙස හැසිරීමේ වරද කියා දී කා.පො.කො. 8206 මහේෂිකා නිලධාරිනිය විසින් පැය 1510ට සැකකරු අත්අඩංගුවට ගෙන ඇත. කෙසේනමුත් පැමිණිලිකරු එලෙස හැසිරුණු බව පිළිගත හැකි සාක්ෂි මඟින් තහවුරු කිරීමට වගඋත්තර පාර්ශවය අපොහොසත්ව ඇති අතර, පැමිණිලිකරු බීමතින් නොසිටි බවට අධිකරණ වෛද්‍යවරයා විසින් ද තහවුරු කර ඇත.

ඒ අනුව, මෙම ප්‍රශ්නගත කාරණයේදී 2023.10.25 දින පැය 1510ට පිටිගල පොලිස් ස්ථානයේදී නීතියෙන් පිළිගත් පටිපාටි අනුගමනය කිරීමකින් තොරව, අත්තනෝමතික ලෙස කා.පො.කො. 8206 මහේෂිකා නිලධාරිනිය විසින් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම තුළින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(1) ව්‍යවස්ථාව මඟින් සුරක්ෂිත කර ඇති "නීතියෙන් නියම කරනු ලැබූ කාර්යපටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තකු සිරභාරයට ගැනීම නොකළ යුත්තේය" යන අයිතිවාසිකම දෙවන වගඋත්තරකාරිය විසින් මෙම පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

2. තවද පැමිණිලිකරු විසින් පොලිස් ස්ථානය වෙත පැමිණ සිටි මහජනතාව ඉදිරියේ පරුෂ වචන කියමින්, පොලිස් නිලධාරීන්ට හා පැමිණිලි විභාග කිරීමට පැමිණි කාන්තාවන් කිහිපදෙනෙකුට බැන වදිමින්, පැමිණ සිටි මහජනතාවට අප්‍රියජනක වචනවලින් බැන අඬ ගසමින් හැසිරුණු නමුත් තමාට සාපරාධී බලහත්කාරය පෑමක් සිදු නොකළ බවට කා.පො.කො. 8206 මහේෂිකා නිලධාරිනිය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පෙනී සිටිමින් ප්‍රකාශ කර ඇත. එසේ තිබියදී සැකකාර චතුර රංගන ද සිල්වා යන අය සම්බන්ධයෙන් 2023.11.07 දින බී වාර්තාවක් මඟින් ඇල්පිටිය මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කිරීමේදී එදින පිටිගල පොලිස් ස්ථානයේ වැඩබලන ස්ථානාධිපති ලෙස කටයුතු කළ උ.පො.ප. වික්‍රමසිංහ මහතා නිසිපරිදි කරුණු සොයා බැලීමකින් තොරව නොසැලකිලිමත් ලෙස කටයුතු කරමින් කා.පො.කො. 8206 මහේෂිකා නිලධාරිනිය හට සාපරාධී බලහත්කාරය පෑමක් සිදුවූ බවට අධිකරණය වෙත අසත්‍ය කරුණු වාර්තා කිරීමට කටයුතු කිරීම තුළින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මඟින් සුරක්ෂිත කර ඇති "නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද, නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය" යන අයිතිවාසිකම තෙවන වගඋත්තරකරු විසින් මෙම පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

3. මෙම අත්අඩංගුවට ගැනීම 2023.10.25 දින සිදුවී ඇතත් ඒ සම්බන්ධයෙන් අධිකරණය වෙත වාර්තා කර ඇත්තේ 2023.11.07 දින ය. එනම්, අදාළ අත්අඩංගුවට ගැනීමෙන් දින 13කට පසුව ය. අදාළ අත්අඩංගුවට ගැනීම සිදුවූ අවස්ථාව වන විට පො.ප. ජී.ඒ.ඒ. පුෂ්පකුමාර මහතා ඇල්පිටිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වශයෙන් කටයුතු කර ඇති නමුත් එකී සිදුවීම සම්බන්ධයෙන් නොපමාව අධිකරණය වෙත කරුණු වාර්තා කිරීමට කටයුතු කර නොමැත. එමෙන්ම කා.පො.කො. 8206 මහේෂිකා නිලධාරිනිය හට සාපරාධී බලහත්කාරය පැමක් සිදුවූ බවට සඳහන් කරමින් 2023.11.07 දින මුල්වරට අධිකරණය වෙත කරුණු වාර්තා කර තිබියදී ඒ සම්බන්ධයෙන් නිසිපරිදි සොයා බැලීමකින් තොරව 2023.12.14 දින අධිකරණය වෙත වැඩිදුර කරුණු ඉදිරිපත් කළ අවස්ථාවේදී ද අදාළ කරුණු සංශෝධන කිරීමට කටයුතු කිරීමකින් තොරව ඇල්පිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වූ අංක 35302 දරණ නඩුව තවදුරටත් පවත්වාගෙන යාමට කටයුතු කිරීම තුළින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මඟින් සුරක්ෂිත කර ඇති "නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද, නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය" යන අයිතිවාසිකම පළමු වගඋත්තරකරු විසින් මෙම පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය කර සිටී.**

I. 2023.10.25 දින පැය 1510ට පිටිගල පොලිස් ස්ථානයේදී නීතියෙන් පිළිගත් පටිපාටි අනුගමනය කිරීමකින් තොරව අත්තනෝමතික ලෙස දෙවන වගඋත්තරකරු වන කා.පො.කො. 8206 මහේෂිකා නිලධාරිනිය විසින් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම තුළින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාව මඟින් සුරක්ෂිත කර ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට තහවුරු වී ඇති බැවින්, දෙවන වගඋත්තරකරු වන කා.පො.කො. 8206 මහේෂිකා විසින් පැමිණිලිකරු වෙත රු.10,000/-ක මුදලක් ගෙවිය යුතුය. අදාළ ගෙවීම් සිදුකර දෙවන වගඋත්තරකරු විසින් ඒ පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

<u>**පොලිස්පතිවරයා විසින්,**</u>

I. පළමු වගඋත්තරකාර පාර්ශවය වන පිටිගල පොලිස් ස්ථානයේ හිටපු ස්ථානාධිපති ලෙස රාජකාරි කළ පො.ප. ජී.ඒ.ඒ. පුෂ්පකුමාර නිලධාරියා මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය

සම්බන්ධයෙන් පරීක්ෂා කර සුදුසු විනය පියවර ගත යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

II. දෙවන වගඋත්තරකාර පාර්ශවය වන පිටිගල පොලිස් ස්ථානයේ කා.පො.කො. 8206 මහේෂිකා නිලධාරිනිය මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය සම්බන්ධයෙන් පරීක්ෂා කර සුදුසු විනය පියවර ගත යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

III. තෙවන වගඋත්තරකාර පාර්ශවය වන පිටිගල පොලිස් ස්ථානයේ වැඩබලන ස්ථානාධිපති ලෙස රාජකාරි කළ උ.පො.ප. වික්‍රමසිංහ අධීක්ෂණ නිලධාරියා ලෙස මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය සම්බන්ධයෙන් පරීක්ෂා කර සුදුසු විනය පියවර ගත යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

2026. 08.28 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ අදාළ නිර්දේශය ක්‍රියාත්මක කර තිබේද නැද්ද යන්න පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වා සිටිමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු,
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් -: (01) අමාත්‍යතුමා, - කාරුණික දැනගැනීම සඳහා
මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
18 වන මහල, සුහුරුපාය,
බත්තරමුල්ල.

(02) ලේකම්, - කාරුණික දැනගැනීම සඳහා
මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
18 වන මහල, සුහුරුපාය,
බත්තරමුල්ල.

(03) පොලිස්පති, - අවශ්‍ය පියවර ගැනීම සඳහා
පොලිස් මූලස්ථානය,
කොළඹ 02.